**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**--------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනය 2015 අප්‍රේල් 10 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුලි 07 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනයකළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**---------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
**-------------------------**

ප්‍රයෝජනයට ගන්නා ඉඩම් හා ගොඩනැගිලිවල අගය ප්‍රත්‍යාගණනය කර දැක්විය යුතු වුවද, රු.179,733,440 ක්වූ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුල ප්‍රාග්ධනිත කරන ලද රු. 40,408,512 ක ඉඩම්වල වටිනාකමද අදාල තැගි ඔප්පුවල ඇති වටිනාකම දක්වා තිබුණ අතර , ඒවාද ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
**------------------------**

පහත සඳහන් නිරීක්ෂණයක් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතු කල අගය මත බදු ලෙස දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවීමට ඇති රු. 636,898 ක් ණය හිමියන් යටතේ ගිණුම්ගත කර තිබියදී ණය ගැතියන් යටතේද එකතු කල අගය මත බදු ලෙස රු. 3,399,994 ක ව්‍යාජ වත්කමක් ගිණුම්ගත කර තිබුණි.

(ආ) අස්ථාන ගතවූ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයේ වටිනාකම රු.156,550 ක් අලාභ ලෙස සලකා වත්කම් ගිණුම් වලින් ඉවත් කර ඇතත් ප්‍රාග්ධන යෙදවුමට අදායමින් දායකවීමේ ගිණුමට ගැලපීම් කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේදි ලැබී තිබු රු. 660,000 ක් වටිනා ගැල්වනයිස් බට 600 න් 161 ක වටිනාකම වූ රු. 177,100 ක් පාඩු හා හානි ගිණුමට ද , ඉතිරි බටවල වටිනාකම වු රු.482,900 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කලයුතු වුවද, මුළු වටිනාකම පොදු ගබඩා ගිණුමට මාරු කර තිබුණි.

1.3.3 **නොසැසඳූ පාලන ගිණුම්**

---------------------------

(අ) ගිණුම් විෂයයන් 06 කට අදාලව ඉදිරිපත් කර තිබූ උපලේඛන අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව වූ ශේෂයන් අතර රු.14,501,118 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

(ආ) වෙන්නප්පුව උප කාර්යාලයේ බදුකුලී හා කඩකුලීවලට අදාල උපයෝගී ලේඛන අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව වූ ශේෂයන් අතර රු.5,726,022 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

1.3.4 අවිනිශ්චිත ගිණුම

--------------------

ලංකා බැංකුවේ වෙන්නප්පුව ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක 0001865986 දරණ ජංගම ගිණුමට අදාළව 2014 දෙසැම්බර් මස බැංකු සැසඳුම තුළ අනාවරණය වූ රු.384,602 ක අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට හෝ ඒ පිළිබඳ පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 **විගණන සඳහා සාක්ෂි නොමැතිවීම**

---------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.492,273,413 ක් වටිනා ගිණුම් විෂයයන් 11 සම්බන්ධව ලේඛන හා විස්තරාත්මක උපලේඛන යනාදී සාක්ෂි නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.6 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| **නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත | |
| (i) 136 වගන්තිය | සභා සීමාව තුල පිහිටි සභාවට අයත් බදු දෙන ලද හෝ කුලියට දෙන ලද සියළු ඉඩම් හා ගොඩනැගිලිවල බදුකරුවන්ගෙන් වරිපනම් බද්ද හෝ අක්කර බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු වුවත්, සභා සතු දේපල 245 කට අදාළව පනතේ විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත 03 පරිච්ඡේදයේ | |
| 20 වගන්තිය | බදු සඳහා ලියාපදිංචි තැනැත්තෙකු බව දැක්වීමට බදු ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කළයුතු වුවත්, සභාව විසින් ඉන්වොයිස් පත්‍රයක් නොමැතිව 2015 වර්ෂයේදී අවස්ථා 32 කදී කොන්ත්‍රාත්කරුවන්ට එකතු කළ අගය මත බදු ලෙස රු. 879,883 ක් ගෙවා තිබුණි. |

(ඇ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති

----------------------------

| | |
|---|---|
| (i) අංක 2(1) (ඇ) හා අංක 3 රීතින් | සභාවේ කාර්යය මණ්ඩලය වෙත පැවරෙන කාර්යයන් අප්‍රමාදවද, නිවැරදි අයුරින්ද ඉටු කෙරෙන බවට වගබලාගත යුතු වුවද, 2015 වර්ෂය සඳහා සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය ගණනය කිරීමක් කර නොතිබුණි. |
| (ii) අංක 5(3) රීතිය | ආදායම් එක් රැස්කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පරීක්ෂාවක් පවත්වා නොතිබුණි. |
| (iii) අංක 5(6) රීතිය | අදාල නිලධාරීන් නියමිත කාලසීමාව තුළදී ප්‍රාදේශීය සභාව වෙත අයවිය යුතු සියළු ආදායම් හා වෙනත් ගාස්තු එකතු කර නොතිබුණි. |
| (iv) අංක 10(2) රීතිය | එක් එක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම සඳහා ඉලක්ක දිනයන් නියම කිරීමට සහ ඉලක්ක දිනයන්ට අනුකූල වන පරිදි එක් එක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන බවට වග බලා ගෙන නොතිබුණි. |
| (v) අංක 10(8) රීතිය | සභාවේ සියළුම වත්කම්වල සුරක්ෂිතභාවය සහතික කරලීමට කටයුතු කල යුතු වුවත් සභාව සතුව තිබූ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය, හීනෝ මෝටර් රථය හා වේලා සටහන් කිරීමේ යන්ත්‍රයක් අස්ථානගත වී තිබුණි. |
| (vi) අංක 59 රීතිය | සෑම වර්ෂයක් ආරම්භයේදීම සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයන් පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර අදාල වර්ෂයේ මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (vii) අංක 218 රීතිය | සභාවේ සියලු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කරවීමට පරීක්ෂණ මණ්ඩලයක් පත් කර නොතිබුණි |

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

------------------------------

| | |
|---|---|
| 2015/11 හා 2015 මැයි 20 දිනැති චක්‍රලේඛයේ 7 වන ජේදය | සභාව 2015 වර්ෂය සඳහා නිල ඇඳුම් දීමනා වෙනුවෙන් රු. 607,400 ක් වියදම් දරා තිබූ නමුත් සභාවේ කිසිඳු නිලධාරියෙකු හෝ සේවකයෙකු නියමිත නිල ඇඳුමින් සැරසී නොසිටි බව 2016 අප්‍රේල් 5 දින කරන ලද පරික්ෂාවේදී නිරීක්ෂණය විය. |

2. **මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ, පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 37,799,622 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 38,599,107 ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා පිළිවෙලින් රු. 26,389,584 ක් හා රු. 80,436,306 ක් වූ මූලධන ආදායම හා රු. 48,771,228 ක් හා රු.118,490,311 ක් වූ මූලධන වියදම් ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 15,417,979 ක් වී තිබුණ අතර, ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.545,102 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 14,872,877 ක වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

-----------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ සභාවේ මුළු මෙහෙයුම් අයභාරය රුපියල් මිලියන 226 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ මුළු මෙහෙයුම් අයභාරය රුපියල් මිලියන 193 හා සසඳන විට රුපියල් මිලියන 33 ක වැඩිවීමක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මූලධන වියදම රුපියල් මිලියන 48 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ මූලධන වියදම වූ රුපියල් මිලියන 118 හා සැසඳීමේදී රුපියල් මිලියන 70 ක අඩුවීමක් විය.

(ඇ) ඉහත තත්ත්වයන් හේතු කොටගෙන වර්ෂය සඳහා වන අතිරික්තය රුපියල් මිලියන 15 ක් වී ඇති අතර, එය ඉකුත් වර්ෂයේ අතිරික්තය වූ රුපියල් මිලියන 0.5 හා සැසඳීමේදී රුපියල් මිලියන 14.5 ක මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයක් විය.

**2.3** ආදායම් පරිපාලනය

---------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ආදායම් බිල් කිරීම,ආදායම් රැස් කිරීම් හා හිගහිටි ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| <u>ආදායම් ශීර්ෂය</u> | | <u>ආදායම් බිල් කිරීම</u> | | | <u>ආදායම් රැස්කිරීම</u> | | | <u>හිග හිටි ආදායම</u> | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015.01.01 දිනට හිඟ හිටි රු. | 2015 වර්ෂයේ බිල් කිරීම් රු. | එකුතව රු. | හිඟයෙන් රැස්කල මුදල රු. | බිල් කිරීමෙන් රැස්කල මුදල රු. | ඉදිරි වර්ෂය සඳහා රැස් කල මුදල රු. | රැස්කල මුළු මුදල රු. | හිඟයෙන් ඉතිරි මුදල රු. | බිල්කල ආදායමෙන් හිඟ හිටි මුදල රු. | එකතුව රු. |
| වරිපනම් බදු | 5,636,264 | 9,084,081 | 14,720,345 | 1,819,128 | 6,999,637 | 1,352,811 | 10,171,576 | 3,817,136 | 2,084,444 | 5,901,580 |
| අක්කර බදු | 304,556 | 14,724 | 319,280 | 27,899 | 6,096 | 1,277 | 35,272 | 276,657 | 8,628 | 285,285 |
| ජල බදු | 3,446 | | 3,446 | | 34,775 | | 34,775 | 3,446 | 34,775 | 38,221 |
| කඩ කුලී | 2,371,207 | 6,194,269 | 8,565,476 | 1,578,348 | 4,294,104 | 121,635 | 5,994,088 | 792,858 | 1,900,164 | 2,693,022 |
| බදු කුලී | 1,978,367 | 25,315,540 | 27,293,907 | 185,421 | 25,119,217 | 1,951,851 | 27,256,489 | 1,792,946 | 196,322 | 1,989,268 |
| බලපත්‍ර ගාස්තු | 10 | 1,966,550 | 1,966,560 | | 1,966,550 | | 1,966,550 | 10 | | 10 |
| වෙනත් ආදායම් | 119,826,014 | 188,021,195 | 307,847,209 | 1,809,319 | 62,920,510 | | 64,729,829 | 118,016,695 | 125,100,684 | 243,117,379 |

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

-----------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය<br>----------------- | අයවැයගත | තථ්‍ය ලැබීම් | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | අයවැයගත | තථ්‍ය ලැබීම් | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් බදු | 9,645 | 9,082 | 5,736 | 9,727 | 8,816 | 5,941 |
| බදු කුලී | 35,786 | 25,340 | 1,958 | 47,515 | 24,874 | 1,978 |
| බලපත්‍ර ගාස්තු | 4,606 | 1,956 | - | 7,908 | 3,922 | - |
| වෙනත් ආදායම් | 64,067 | 182,304 | 125,543 | 7,430 | 5,622 | 2,381 |

2.3.2 **වරිපනම් බදු**

--------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අය කල යුතු වරිපනම් බදු මුදලින් සියයට 65 බදු ප්‍රතිශතයක් අය කර තිබූ අතර, වසර අවසාන හිඟ වරිපනම් බදු ප්‍රමාණය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.267,919 කින් වැඩිවී තිබුණි. එසේම වරිපනම් බදු බිල් කිරීමේ රු.32,973 ක සමස්ථ අඩුවීමක් නිරූපනය කල අතර, උප කාර්යාල 02 ක වරිපනම් බදු බිල්කිරීම රු.33,797 ක් අඩුවෙන් සිදු කර තිබුණි.

(ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 143 වගන්තියේ විධිවිධාන අනුව සභා බල ප්‍රදේශය තුළ පිහිටි සියලු ඉඩම් හා ගොඩනැගිලි සෑම වසර 05 කට වරක් තක්සේරුවක් කළ යුතු වුවත්, සභාවේ පවතින වරිපනම් තක්සේරුව වසර 07 ක් ඉක්මවා තිබුණි.

(ඇ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 143 (i) (2) වගන්තියේ විධිවිධාන අනුව වරිපනම් බදු තක්සේරුවකින් පසු ඉදිවන ගොඩනැගිලි වෙනුවෙන් අළුත් තක්සේරුවක් සිදු කර වරිපනම් බදු අය කළ යුතු වුවත්, 2015 වර්ෂයට අනුකූලතා සහතික 72 නිකුත් කර තිබුණද, 2015 වර්ෂයේ අළුතින් එකතු වී තිබුනේ එක් බදු ඒකකයක් පමණි.

(ඈ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගනයේ විධිවිධාන අනුව වරිපනම් හා අක්කර බදු හිඟ මුදල් අයකර ගැනීම සඳහා එම බදු ගෙවිය යුතු අයගේ චංචල හා නිශ්චල දේපල තහනමට ගෙන විකිණීම සඳහා සභාවේ ලේකම්වරයා විසින් සභාවේ මුදල් එක්රැස් කරන අයට බලපත්‍ර ලබාදී නොතිබුණි.

(ඉ) 1988 ප්‍රාදේශීය සභා (මුලා හා පරිපාලන) රීති අංක 33 පරිදි වරිපනම් බදු ගෙවීම පැහැර හරින බදුකරුවන් පිළිබඳව ලැයිස්තුවක් සහ දේපළ තහනම් කිරීමේ වරෙන්තු එක් එක් කාර්තු අවසානයේදී වරිපනම් බදු ලිපිකරු විසින් පිළියෙල කොට ලේකම්වරයාගේ අත්සන සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2.3.3 **දේපල බදු දීම**
----------------

(අ) සමාලෝචිත වර්ෂයේදී සභාව සතු බදු දේපල 73 න් 19ක් බදු දී නොතිබූ අතර, අවම ලංසු වටිනාකම පදනම් කරගත්තේ නම් අහිමි වූ ආදායම රු.9,988,102 ක් විය.

(ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගනයේ විධිවිධාන අනුව ප්‍රාදේශීය සභාව විසින් කුලියට දෙන යම් ස්ථානයක කුලිය වශයෙන් අයවිය යුතු මුදල අයවිය යුතුව තිබූ දින සිට දින 14 ක් ඇතුලත ගෙවනු නොලැබුව හොත් ප්‍රාදේශීය බල ප්‍රදේශය තුල පිහිටි ඒ කුලී නිවැසියාට අයිති වූ සියළුම නිශ්චල හා චංචල දේපල තහනමට ගෙන විකිණීමෙන් ඒ මුදල හා ගාස්තු අයකර ගැනීම කළ යුතු වුවත්, එසේ ක්‍රියාකර නොමැති අවස්ථා නිරීක්ෂණය විය.

2.3.4 **වෙනත් ආදායම්**
-------------------

(අ) සභාව විසින් වෙන්නප්පුව හා දංකොටුව නගර දෙකෙහි ත්‍රීරෝද රථ ගාල් ලියාපදිංචි කිරීමේ ගාස්තු හා වෙන්නප්පුව බස් රථ නැවතුම්පල ගාස්තුද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත154 (1) වගන්තියේ විධිවිධාන අනුව ප්‍රාදේශීය සභාවක සීමාවන් ඇතුළත වූ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක් ප්‍රාදේශීය සභාවට අයවිය යුතු වුවත්, ඇස්තමේන්තු විකුණුම් මුදලින් සියයට එකක් පමණක් අයකරගෙන තිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශය තුළ දැන්වීම් පුවරු විශාල ප්‍රමාණයක් 2016 ජනවාරි 13 දින කරන ලද නියැදි යෙදු පරීක්ෂණය නිරීක්ෂණය වුවද, 2015 වර්ෂය සඳහා ගාස්තු ගෙවා තිබුනේ දැන්වීම් පුවරු 43 කට පමණි.

(ඈ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වූ පහත දැක්වෙන අංශයන්ගෙන් ආදායම් රැස් කිරීමට පනතේ විධි විධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

i. උල්හිටියාව ප්‍රදේශයේ දිනපතා පවත්වා ගෙන යන සිල්ලර මාළු වෙළඳාම

ii. ප්‍රදේශය තුළ පිහිටා ඇති ජංගම දුරකථන කුළුණු 14 සඳහා ගාස්තු පනවා අය කිරීම

iii. ප්‍රදේශයේ පවතින කුලී රථගාල් සඳහා ගාස්තු පනවා අය කිරීම.

2.3.5 බලපත්‍ර ගාස්තු
---------------

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියේ විධිවිධාන අනුව ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව බලපත්‍ර ගාස්තු අයකළ යුතු වුවත් සභා සීමාව තුළ ඇති ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි ව්‍යාපාර ආයතන 10 කින් 04 ක් නියමයන් ප්‍රකාරව බලපත්‍ර ගාස්තු ගෙවා නොතිබූ අතර, මෙම ආයතනවලින් අයකල ගාස්තු වෙනුවෙන් එකතු කළ අගය මත බද්ද, ජාතික ගොඩනැගීමේ බද්ද හා මුද්දර බද්ද අයකර ප්‍රේෂණය නොකිරීමෙන් රජයට අහිමි කල බදු වටිනාකම 2014 වර්ෂය සඳහා රු. 244,780 ක්ද, 2015 වර්ෂය සඳහා රු. 214,648 ක්ද විය.

2.3.6 **උසාවි දඩ**
-----------

වයඹ පළාතේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.5,693,259 ක උසාවි දඩ අයවිය යුතුව තිබුණි.

2.3.7 **මුද්දර ගාස්තු**

සමාලෝචිත වර්ෂය අවසානයට වයඹ පළාතේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අය කරගත යුතුව තිබූ මුද්දර ගාස්තු වටිනාකම රු. 16,301,623 ක් විය.

2.4 **අධිභාර**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 172 (3) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවළුන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් පණවන ලද අධිභාර අනුව 2009 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාර මුදල රු. 326,335 ක් විය.

3. **වියදම් ව්‍යුහය**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ, අයවැයගත හා තථ්‍ය වියදම් අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| **වියදම් විෂයය** | **2015** අයවැයගත වියදම් | **2015** තථ්‍ය වියදම් | **2015** විචලනය | **2014** අයවැයගත වියදම | **2014** තථ්‍ය වියදම | **2014** විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු000. | රු000. | රු000. | රු000. | රු000. | රු000. |
| පෞද්ගලික | 88,418 | 113,472 | (25,054) | 65,081 | 74,392 | (9,311) |
| පඩිනඩි | 89,218 | 74,036 | 15,182 | 103,232 | 80,606 | 22,626 |
| අනෙකුත් | | | | | | |
| | 177,636 | 187,508 | (9,872) | 168,313 | 154,998 | 13,315 |
| උප එකතුව | 95,300 | 48,006 | 47,294 | 47,791 | 118,490 | (70,699) |
| ප්‍රාග්ධන වියදම් | | | | | | |
| | 272,936 | 235,514 | 37,422 | 216,104 | 273,488 | (57,384) |

4. **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා බැංකුව වෙන්නප්පුව ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක 0001865986 දරණ ජංගම ගිණුමේ බැංකු සැසඳුම් ප්‍රකාශනයට අනුව 2013 වර්ෂයේ මැයි මාසයේ සිට ඉදිරියට ගෙන එන ලද රු.33,955 ක් වටිනා අඟරු චෙක්පත්වලට අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2009 සැප්තැම්බර් 25 දිනැති අංක 1574 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද උපදෙස් ප්‍රකාරව දියුණු ගම් ප්‍රදේශවල නව වරිපනම් බදු ඒකක කඩිනමින් හඳුනාගෙන බදු අයකර ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ වෙන්දේසි කරන ලද ඉඩම්වලින් කහටවිල මකුල්ල ගහවත්ත නොහොත් කජුගහවත්ත ඉඩම සඳහා පොදු පහසුකම් වෙනුවෙන් ලැබිය යුතු පර්චස් 52.4 ක බිම් කොටස සභාවට පවරා ගෙන නොතිබුණි.

4.2 හඳුනාගත් අලාභ
-------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතුව පැවති රු.156,550 ක් වටිනා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය අස්ථාන ගත වී ඇතත් ඒ සඳහා වගකීම නිශ්චය කර එම අලාභය වගකිවයුතු අයගෙන් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(ආ) වෙන්නප්පුව වෙළඳ සංකීර්ණයේ වර්ග අඩි 4440 කින් යුක්ත උඩුමහල වර්ෂ 03 කට අධික කාලයක සිට ආදායමකින් තොරව වෙළඳ සංගම් හා වෙනත් සංවිධාන වෙත පවරා තිබුණි. මෙසේ සභාව සතු වත්කම් බාහිර පාර්ශව වෙත අය කිරීමකින් තොරව පවරා දීමෙන් සභා අරමුදලට ලබාගත හැකිව තිබූ ආදායම් රු. 255,000 ක් අහිමිවී තිබුණි.

(ඇ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබුණු ගැල්වනයිස් බට 161 ක් අස්ථානගතවී තිබූ අතර, එහි වටිනාකම රු.177,100 ක් විය.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
------------------------------------------

5.1 අභ්‍යන්තර විගණනය
-----------------------
ආයතනය තුළ ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම
---------------------
2014 පෙබරවාරි 17 දින හා අංක PFD/RED/01/04/2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 (අ) සිට (ඊ) දක්වා ඡේද ප්‍රකාරව දිගු කාලීන දැක්මක් සහිතව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කල යුතු වුවත්, ඊට වෙනස් ආකාරයේ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි.

5.3 වත්කම් කළමනාකරණය
---------------------------

5.3.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
------------------------------------
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2015 ජූනි මස ලැබී තිබූ අංක WPLL-7703-FOTON දරණ වතුර බවුසරය විගණන දිනය වූ 2016 පෙබරවාරි 08 වන විටත් කිසිඳු ප්‍රයෝජනයකට නොගෙන ගාල් කර තිබුණි. වෙන්නප්පුව ප්‍රදේශීය සභා බල ප්‍රදේශයේ තුළ නිවැසියන්ට බවුසර් මඟින් ජලය ලබා ගැනීමේ අවශ්‍යතාවයක් නොතිබියදී, එවැනි අවශ්‍යතාවයක් ඇති වෙනත් ස්ථානයකට යොමු කිරීමට කටයුතු නොකර නිෂ්ක්‍රීයව තබාගෙන තිබුණි.

**5.3.2 සමීක්ෂණය නොකල වත්කම්**
--------------------------------
ඉඩම් කට්ටිකර විකිණීමේදී පොදු පහසුකම් වෙනුවෙන් සභාවට ලබාදී තිබූ ඉඩම් කට්ටි සමීක්ෂණ මණ්ඩලයක් මගින් සමීක්ෂණය කර අයිතිය තහවුරු කරගෙන ආරක්ෂා කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

5.4 මානව සම්පත් කළමණාකරණය

----------------------------------

අනුමත තථ්‍ය සේවක සංඛ්‍යාව

----------------------------------

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 05 | 04 | 01 | - |
| ද්විතීයික | 64 | 60 | 04 | - |
| ප්‍රාථමික | 110 | 188 | | 78 |
| | 179 | 252 | 05 | 78 |

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විධායක ශ්‍රේණියේ තනතුරක් වූ කාර්මික නිලධාරී (විශේෂ ශ්‍රේණිය) තනතුර වසර කිපයක් තිස්සේ පුරප්පාඩුව පැවතුණි.

(ආ) ද්විතීයික ශ්‍රේණියේ අනුමත නොවූ තනතුරක් සඳහා එක් අයෙකුද ප්‍රාථමික ශ්‍රේණියේ අනුමත නොවූ තනතුරු 05 ක් සඳහා 64 දෙනෙකුද බඳවා ගෙන තිබුණි. එහෙත් එම තනතුරු අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

**-------------------**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) ණයගැති හා ණයහිමි පාලනය

(ඊ) වත්කම් කළමනාකරණය

(උ) සේවක ණය කළමණාකරණය